# විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඉංග්‍රිසි මාධ්‍යයෙන් පැවැත්වෙන දේශන සඳහා උපාධි අපේක්ෂකයින්ගේ සහභාගිත්වයේ ප්‍රවණතාවය විමසීම.

**ජේ. එම්. ඒ. රෝහණ**[1]

## සංක්ෂේපය

විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වඩාත් කතාබහට ලක්වෙන මාතෘකාවක් ලෙස ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන දේශන දැක්විය හැක. ශ්‍රී ලාංකිකයන් වන අපගේ මව් භාෂාව සිංහල වුවද විශ්වීය භාෂාව වන ඉංග්‍රීසි අකමැත්තෙන් හෝ ඉගෙන ගතයුතු භාෂාවකි. භාෂාවක් යනු, මිනිසුන් අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් හා සන්නිවේදනය සඳහා යොදාගනු ලබන වාග් සංකේත වේ. මෙහිදී සිංහල, මව් භාෂාව වන අපගේ උසස් අධ්‍යාපන කටයුතු වලදී ඉංග්‍රීසි මාධ්‍ය දේශන සඳහා යොමුවීම මෙන්ම එම විභාග සඳහා පෙනී සිටීම අනිවාර්ය වී ඇත. එබැවින් මෙහි මූලික අරමුණ වූයේ, සිංහල මාධ්‍ය විෂයන්ට සාපෙක්ෂව ඉංග්‍රීසි විෂයයන්ගේ දේශන සඳහා සහභාගිත්වයේ වෙනසක් පවතිනවා ද යන්න හඳුනා ගැනීම විය. ඒ සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන දේශන සඳහා උපාධි අපේක්ෂකයින්ගේ සහභාගිත්වයේ ප්‍රවණතාවය පිළිබඳ රුහුණු විශ්වවිද්‍යාලයීය සිසුන් 100ක් ඇසුරින් ලබාගත් නියැදියක් මඟින් මෙම අධ්‍යයනය කරන ලදී. ප්‍රශ්නාවලි ක්‍රමය මඟින් ප්‍රාථමික දත්ත රැස්කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී.ලබාගත් දත්ත බොහොමයක් ගුණාත්මක දත්ත වන බැවින් ඒ සඳහා වඩාත් උචිත සංඛ්‍යාන ශිල්පීය ක්‍රමයන් භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණය අනුව, උපාධි අපේක්ෂකයින්ගේ, සිංහල මාධ්‍ය විෂයන්ට සාපේක්ෂව ඉංග්‍රීසි මාධ්‍ය විෂයයන්ගේ දේශන සඳහා සහභාගිත්වය 78% න් අඩු වී ඇති බව හෙළි විය. මේ සඳහා හේතු විමසීමේදී හෙළි වූයේ, ඉංග්‍රීසි මාධ්‍ය දේශන සඳහා සහභාගි වීමට උපාධි අපේක්ෂකයින් තුළ වූ අකමැත්ත, දේශන නොතේරීම, දේශන වලදි අසනු ලබන ප්‍රශ්න වලට පිළිතුරු ලබාදීමේ නොහැකියාව යන කරුණු දැක්විය හැක. මේ අනුව සිංහල මාධ්‍ය විෂයන්ට සාපේක්ෂව ඉංග්‍රීසි මාධ්‍ය විෂයයන්ගේ දේශන සඳහා සහභාගිත්වය අඩු වී ඇති බව නිගමනය කළ හැක. මෙම ගැටලුව අවම කර ගැනීමට පාඨමාලා හැදෑරීමේදි තම කැමැත්ත පරිදි ඒවා සිංහල හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට අවස්ථාව ලබා දීම, සෑම ශිෂ්‍යයකුගේම ඉංග්‍රීසි භාෂාව තේරුම් ගැනීමේ හැකියාව එක හා සමාන නොවන නිසා ඉගැන්වීම් ක්‍රියාවලියට ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් කිරීම යෝජනා ලෙස දැක්විය හැක.

**මුඛ්‍ය පද :** ඉංග්‍රීසි භාෂාව, දේශන, විද්‍යාර්ථීන්, විෂයන්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය, athula.hln@gmail.com